මෙම වසරේ මාස 9 ක කාලයක් තුළ සුරාබදු දෙපාර්තමේන්තුව මගින් දීපව්‍යාප්තව සිදුකරනු ලැබූ මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාලේඛන සම්බන්ධයෙන් දිනමිණ පුවත්පතේ (20/21) පළ වී තිබූ පුවත් වාර්තාවක සිරස්තලය වූයේ, "මත් වැරදි කළ වැඩි දෙනා කාන්තාවෝ" යනුවෙනි. කෙසේ නමුත්, පුවත් වාර්තාව තුළ දැක්වී තිබුණේ වැටලීම් 30,391 කින් පුද්ගලයින් 30,354 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බවත්, ඒ අතරින් 3,020 ක් කාන්තාවන් වන බවත් වේ.

මෙහි දක්වා ඇති සංඛ්‍යාලේඛන නිවැරදි නම්, මත්ද්‍රව්‍ය වැටලීම් ඔස්සේ අත්අඩංගුවට ගෙන ඇති කාන්තාවන් ප්‍රමාණය, අත්අඩංගුවට ගත් සමස්ත පුද්ගලයින් සංඛ්‍යාවෙන් ආසන්න වශයෙන් 9.95% ක් පමණක් වේ. එසේ නම් මත් වැරදි කළ වැඩිදෙනා කාන්තාවන්‍ය යන මෙම සිරස්තලය දෝෂ සහගත වේ. යම් හෙයකින් සිරස්තලය නිවැරදි යැයි ගන්නේ නම්, පුවත් වාර්තාවේ දක්වා ඇති සංඛ්‍යාලේඛන, මූලාශ්‍ර පරිශීලනයේදී හෝ පළ කිරීමේදී හෝ දෝෂ සහගතව සඳහන් වී ඇත.

අප විසින් මෙම ලිපිය පළවීමෙන් පසු ඉදිරි දින හයක කාලය තුළ ප්‍රකාශයට පත්වූ දිනමිණ පුවත්පත් නිරීක්ෂණය කළද, මේ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් පළ වී නොතිබුණි.

නිරවද්‍යභාවය යනු මාධ්‍ය විසින් රැකිය යුතු ප්‍රධානතම ආචාර ධර්මයක් වන අතරම, යම් හෙයකින් නිරවද්‍යභාවය සම්බන්ධයෙන් දෝෂයක් සිදුවූ විට, වහාම ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් පළ කිරීමද මාධ්‍ය විසින් පිළිපැදිය යුතු ආචාර ධාර්මික හැසිරීමක් වේ. එම කරුණු දෙකම කඩවී ඇති මෙම අවස්ථාවේදී දිනමිණ පුවත්පත එම ආචාර ධර්මයන්ගෙන් පිට පැන ඇතැයි අපට පෙන්වා දීමට සිදුවේ.

**#MediaEthicsSL #lka #SinhalaPress #Dinamina**